උපදෙස් පත්‍රිකා :- 01/2025

මගේ අංකය- DCDSP/02/22/04
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පෙට්ටිගලවත්ත,ගාල්ල.
2025.03.17.

ගරු සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත,
(දකුණු පළාත තුල ලියාපදිංචි සියළුම සමුපකාර සමිති)

**<u>2025 පළාත් පාලන මැතිවරණය සඳහා ඉදිරිපත් වන දකුණු පළාත තුල ලියාපදිංචි සමුපකාර සමිතිවල කාරක සභා (අධ්‍යක්ෂ මණ්ඩල) සාමාජිකයින් සම්බන්ධවයි.</u>**

දකුණු පලාත තුල ලියාපදිංචි සමුපකාර සමිතිවල ඇතැම් කාරක සභිකයින්/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 2025 පළාත් පාලන මැතිවරණය සඳහා අපේක්ෂකයන් වශයෙන් ඉදිරිපත් වන අවස්ථා පවතින අතර, එවැනි අවස්ථාවක ක්‍රියාකල යුතු ආකාරය සම්බන්ධයෙන් මාගේ අංක දප/3/1 හා 1991.04.04 දිනැති උපදෙස් නිකුත් කර තිබුණි.

02. උක්ත අංක දප/3/1 හා 1991.04.04 දිනැති උපදෙස්හි 2.(අ) ඡේදයේ සඳහන් උපදෙස් 2025.03.17 දින සිට මෙයින් අවලංගු කරන අතර, පහත සඳහන් උපදෙස් 2025.03.17 දින සිට ක්‍රියාත්මක විය යුතු බව මෙයින් දන්වමි.

- 2025 පළාත් පාලන මැතිවරණය සඳහා නාම යෝජනා ඉදිරිපත් කරනු ලබන දකුණු පළාත තුල ලියාපදිංචි සමුපකාර සමිතිවල කාරක සභා (අධ්‍යක්ෂ මණ්ඩල) සාමාජිකයින්, තමා එසේ 2025 පළාත් පාලන මැතිවරණය සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බව ඒ සමිතියේ ලේකම් මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයට විධිමත් පරිදි දැනුම් දිය යුතුය.
- එසේ දැනුම්දීමෙන් අනතුරුව මෙම මැතිවරණය අවසාන වන තෙක්, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන යෝජනාවක් අනුව තාවකාලිකව නිවාඩු ලබා ගැනීමට කටයුතු කල යුතුය.
- එලෙස තාවකාලිකව නිවාඩු ලබා ගෙන ඇති කාරක සභිකයින්/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, නිවාඩු ලබා ගත් දින සිට නිවාඩු අවසන් වන දිනය දක්වා සමුපකාර සමිතියට අදාල රාජකාරී කටයුතුවල නිරත නොවිය යුතුය.
- අදාල කාරක සභිකයින්/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් කරනු ලබන යෝජනාව හා ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය ගනු ලැබූ තීරණය අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පොතේ සටහන් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කටයුතු කල යුතුය.

03. කෙසේ වුවද ඉහත පරිදි නිවාඩු ලබා ගනු ලබන කාරක සභා/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පහත කොන්දේසි වලට අනුකූලව කටයුතු කල යුතු වේ.

- නිවාඩු ලබා ගත් දිනයේ සිට, නැවත මෙම මැතිවරණය අවසන්වී නිවාඩු අවසන් කරන දිනය දක්වා වන කාල සීමාව තුල උක්ත කාරක සභිකයින්/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සමිතිය තුල හෝ සමිතියට අයත් කිසිදු පරිශ්‍රයක සිට සෘජු හෝ වක්‍ර ලෙස දේශපාලන කටයුතු සිදු නොකල යුතු අතර සමිතියේ කිසිදු සේවකයෙක්/දේපළක්/රථ වාහනයන් එවැනි කටයුතු සඳහා යොදා නොගත යුතුය.
- නිවාඩු ලබා ගත් කාරක සභිකයින්/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සමිතිය තුල හෝ සමිතියට අයත් කිසිදු පරිශ්‍රයක සිට සෘජු හෝ වක්‍ර ලෙස දේශපාලන කටයුතු කිරීම හා සමිතියේ කිසිදු සේවකයෙක්/

CamScanner

දේපළක්/ රථ වාහනයන් අවභාවිතා කිරීම වැලැක්වීමට අවශ්‍ය කටයුතු කිරීම සමිතියේ සාමාන්‍යාධිකාරීගේ වගකීම වන අතර එම කාරක සභිකයින්/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ඉහත පරිදි කටයුතු කරනු ලබන බවට වගබලා ගැනීම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් බව අවධාරණය කරමි.

04. ඉහත පරිදි කාරක සභිකයින්/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තාවකාලිකව නිවාඩු ලබා ගැනීම එම තනතුරේ පුරප්පාඩුවක් ඇති වීමක් නොවන බවද, මෙහි කාරක සභිකයා/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා යන්න දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 76 වගන්තියේ සඳහන් කාරක සභාව යන්නෙන් අර්ථ නිරූපනයට අදාල වන බවද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

සී.වික්‍රමසිංහ,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

සී. වික්‍රමසිංහ
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වැ.බ.)
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත.

පිටපත්-

01.සහකාර කොමසාරිස්(ගාල්ල/මාතර/හම්බන්තොට)- අදාල සියළුම සමුපකාර සමිති දැනුවත් කිරීම සඳහා මෙන්ම සමිති භාර නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා

02.සියළුම සමිති භාර නිලධාරීන් - අදාල සියළුම සමුපකාර සමිති දැනුවත් කිරීම සඳහා

03.සියළුම සමුපකාර සමිති ලේකම්වරුන් - මෙම උපදෙස් අනුව කටයුතු කිරීම සඳහා හා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම සඳහා

CS CamScanner